සන්නස SANNASA



# සිද්ධි SIDDHI

අතුල කල්දෙමුල්ල ලියයි

## නිර්මාණ චාරිකාවක මතක සටහන්

80 ව දශකයයි මා රැකියාව කළ ග්‍රාන්ට් ප්‍රචාරකායතනයේ සබන් දැන්වීම කැලැන්ඩරයකට නිරූපණය සඳහා ප්‍රවීන සිනමා නිළියකට ආරාධනා ලැබෙනවා. ඒ ආරාධනාව හා වගකීම මා භාරගෙන ඇය හමුවන්නට මොරටුවේ සොයිසා මහල් නිවාසය කරා ගොස් සියළු විස්තර කතිකා කර ගන්නා අතර තුරේ එහිදී මට මුණ ගැසෙනවා සිනමා හංසවිල කැලතූ එවකට තරුණ අධ්‍යක්ෂවරයෙක්. ඔහුද මැයගේ නිවසේම හමුවීමෙන් අපේ මිත්‍රතත්වය ගොඩනැගෙනවා. ඒ මිත්‍රත්වය අතරින් ඔහුගේ චිත්‍රපට දෙකකම වෙළඳ ප්‍රචාරක කටයුතු කරන්නට අවස්ථාව මට ලබාදෙනවා වගේම ඔහුගේ වෘත්තියට ගරු කරමින් මාගේ වැඩකටයුතු කරගෙන යනු ලබනවා.

**මේ අතරතුර කාලයේ දැනට ඇමතිවරයෙකු වූ එකල ටියුෂන් ගුරුවරයෙකු වූ එක් චිත්‍රපටයක අධ්‍යක්ෂකවරයා මා සොයා මගේ නිවසට පැමිණෙන්නේ ඉතා හදිසි කටයුත්තකටයි. ගුණයෙන් වර්ධනය වූ මුහුණ පෙන්වමින් අයැද සිටින්නේ ඊළඟ දිනයේ බායිරෝ ජාත්‍යන්තර උළෙලට චිත්‍රපටය රැගෙන යන බවත් එහි දැන්වීම් පත්‍රිකා හා රූප රාමු ඇලවූ චිත්‍රපටයේ රූප සහිත කාඩ්පත් වල සියලු දෑ නිර්මාණය කරගත යුතු බවයි.**

වැඩට මුල් තැනදී වැඩ කළත් මිත්‍ර අධ්‍යක්‍ෂවරයා මුදල් අතපසු කරන්නේ ඉතා මිත්‍රශීලිවයි. බාලගිරි අද නොවේ හෙට යන්න සිහියට නැගුනුවාර අපමණය.

මේ අතරතුර කාලයේ දැනට ඇමතිවරයෙකු වූ එකල ටියුෂන් ගුරුවරයෙකු වු එක් චිත්‍රපටයක අධ්‍යක්ෂකවරයා මා සොයා මගේ නිවසට පැමිණෙන්නේ ඉතා හදිසි කටයුත්තකටයි. ගුණයෙන් වර්ධනය වූ මුහුණ පෙන්වමින් අයැද සිටින්නේ ඊළඟ දිනයේ බායිරෝ ජාත්‍යන්තර උළෙලට චිත්‍රපටය රැගෙන යන බවත් එහි දැන්වීම් පත්‍රිකා හා රූප රාමු ඇලවූ චිත්‍රපටයේ රූප සහිත කාඩ්පත් වල සියලු දෑ නිර්මාණය කරගත යුතු බවයි.

මේවා මුද්‍රණය කිරීමට ඇත්තේද පැය කිහිපයක් පමණි. මුද්‍රණාලයේ මුද්‍රණශිල්පියාද නතර කොට මේ හදිසියේ මා සොයා විත් ඇත්තේ "ආප්ප දන ක්‍රමයටය" නිර්මාණ බා ගැනීමටය. මේ දවස මා දැඩි අසනීප තත්වයෙන් රැකියාවටද නොගොස් ගෙදර සිටි දවයකි. මට අම්මාගෙන් නම් බේරුමක් නැත. "ඇයි ළමයෝ සහළවලා උණ. නිදිමරාගෙන ඔච්චා කරලා ඔයාට මොනවාහරි උනාම කව්ද ඉන්නේ." මගේ ඇගේ අමාරු යටපත් කරමින් ඈ සනසන මා නිෂ්පාදකවරයාගේ සිත සුව පිණිස මුළු රැයම නිදිමරා මගේ රාජකාරිය ඉටු කළෙමි. ඔහු උදේ 6 වන විට මා සොයා ආවේ අවසන් වූ සියල්ල රැගෙන යාමටය.

"ලොකු දෙයක් ඔයා කලේ. ඔන්න අපේ ඩිරෙක්ටර්ට ඔයාගේ ඔක්කෝම දේවල් ගෙවනවා හොඳේ.... ඔහු බොහෝම ඉක්මනින් අම්මා නැගිට එන්නට පෙර සිඝ්‍රයෙන් වාහනයට ලිස්සා යයි.

මේ සියල්ල මඳකට අමතක වී යයි. මගේ දේවල් තමා ඉතිං කයිරෝ අරන් යන්නේ... සියුම් සතුටකින් සිත පිරියයි. ඒ වන විටත් දෙවැනි දවසේම රැකියාවට යන්නට පවා නොහැකි වී මගේ අසනීප තත්වය උත්සන්නව තිබුණි.

## වර්ධනය නොවූ ගුණයක්

කාලය ගෙවී යයි. චිත්‍රපටය ආදායම් වාර්තා ලබමින් ප්‍රදර්ශනය කෙරේ. එනමුදු මාහට ගෙවන මුදල් සොච්චම පිළිබඳව නිෂ්පාදකවරයා හෝ අධ්‍යක්ෂකවරයාගෙන් කිසිදු සතුටුදයක පිළිතුරක් නොමැත. කාලයට ඉඩ දුනිමි.

දැලි රැවුල වැවෙන කාලයේම චිත්‍ර ශිල්පියෙකු වශයෙන් රැකියාවට යාම නිසා එතරම් බරපතලක් මගේ සිතට ඒ අවධියේ නොවිය. අධ්‍යක්ෂකවරුන්, නිෂ්පාදකවරුන් නිලියන් දැක්ම, ඔවුන් හා වැඩකටයුතු කිරීම මා සිතුවේ මට ලැබෙන මහත් අභිමානයක් ලෙසයි. ඒ නිසාම මා නොදැනුවත්ම කඩේ ගොස් තිබෙන බැව් දැනෙන්නේ ඊට පසු කාලයකදීය.

දිනෙක මා චිත්‍රපට අධ්‍යක්ෂකවරයා සොයා මොරොන්තුඩුවේ පිහිටි ඔහුගේ නිවස කරා ගියේ මොනයම් හෝ සාධාරණයක් ලබා ගැනීමටය. ඒ වෙලාවේ ඔහු නිවසේ නොසිටි අතර බිරිඳ පැවසුංවි

"මල්ලි අයියා දවසේ ගණකින් ගෙදර ආවේ නැනේ." යන්නකි. අධ්‍යක්ෂවරයා අධ්‍යක්ෂණය කරන චිත්‍රපට අතරට ගොඩනැගෙන පවුල් සංස්ථාවේ චිත්‍රපටයක්ද ප්‍රශ්නයක් වී ඇති බව මට වැටහේ.

ඒ පෞද්ගලික දේවල් තේරුම් ගියත් කලකිරීමකින් යුතුව මුදල් ද අමතක කොට ගෙදර බලා ආවෙමි. මගේ යතුරු පැදියට මොවුනගේ වැඩකටයුතු සඳහා අය කරන මුදල වාගේ දෙගුණයක ඉන්ධනද පුච්චා හමාරය. මා අවසාන වතාවට යයි සිතා ටියුෂන් ගුරුවරයා නිශ්පාදකවරයා පදිංචිව සිටින ජම්බුගස්මුල්ල නිවසට ගියෙමි. එහිදී මා දකින්නේ ඔහු සිය නව මනමාළිය ගෙදරට කැන්දා ආ දවසයි. මා අසන්නට ගිය ප්‍රශ්නය අසන්න දවස මෙය නොවේ යයි හිත කියයි. එනමුත් උපායශිලි ආර්ථික විද්‍යාධාරී, ටියුෂන් ගුරුවර නිශ්පාදකවරයා එකවරම මගෙන් අසෙන්නේ....

"ආ අතුල මුදල් ලැබුනා නේද මං දුන්නා අරයාට ඔක්කෝම. ඔන්න හරි ඉතිං. ඉන්න කූල් ඩ්‍රින්ක් එකක් බීලම යන්න."

මම හදිසි වැඩකට යන ආකාරයෙන් ඔහුගේ කීම අනුමත කළ බව පෙන්වා ඉක්මනින්ම පිටත් වීමි. මේ සියල්ල හතර බීරි කතාවකි. අධ්‍යක්ෂක කියන්නේ නිෂ්පාදකගෙන් ඉල්ලා ගන්න කියාය. නිෂ්පාදක කියන්නේ අධ්‍යක්ෂකගෙන් ඉල්ලා ගන්න කියාය. පසුව මා රැකියාව කළ ආයතනයෙන් කමලා ලවා යතුරු ලියනයෙන් ලිපියක් සකසා මෙසේ ලියා තැපැල් කලෙමි.

"මෙපමණ කලක් මා රස්තියාදු වී ඉල්ලු මුදල් අද වෙනවිටත් ලැබී නැත. මාගේ මුදල් ඉල්ලා සිටින අවසාන අවස්ථාව මෙයයි. මේ ගැන සාධාරණයක් කිරීමට වග බලා ගන්න."

කාලය ගෙවී යයි. ඒ පිළිබඳව කිසිදු ආරංචියක් නොමැත. ඒ දෙපොළ අදටද මා හට ණය කරුවන් වී හමාරය. සැබෑ සිනමාවක් පිඩිත පන්තියක් ගැන කතා කරන්නේ මෙවන් අධ්‍යක්ෂකවරුන්ය. මැති ඇමති තනතුරු හොබවමින් අදද රවටන්නේ මහජනතාවය. නමුත් ඔවුන්ගේ ජීවිතවල කළු පැල්ලම් මකන්නට "කෝවේ" දැම්මාටවත් බැරිය. නිදැල්ලේ සැරිසරන මෙවැනි සොරුන් ගැන දැනුවත් විය යුතුය.

